2566 - මූලික පිරිවෙන් වර්ෂාවසාන විභාගය - 2022(2023)

"සිප්සර සවිය" ඉතිහාසය සිසු නිපුණතා සම්මන්ත්‍රණය
(ඉතිහාසය ගුරු පවුර)

NEW

07 S I,II

# (07) ඉතිහාසය - I, II

පැ තුනයි

අමතර කියවීම් කාලය -මිනිත්තු 10 යි.

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

## ඉතිහාසය - I පත්‍රය

සැලකිය යුතුයි :

* ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු 40 ක් ලැබේ.
* අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4) පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.
* ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින්, ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (x) ලකුණ යොදන්න.
* එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

● අංක 1 සිට 15 දක්වා එක් එක් ප්‍රශ්නයට ගැළපෙන පිළිතුර තෝරන්න. *(ලකුණු 01 × 40 = 40 යි)*

**1.** ලංකා ඉතිහාසය හැදෑරීමේ දී දැනට ඇති පැරණි ම වංසකථාව කුමක්ද?
(1) දාඨාවංසය (2) බෝධිවංසය
(3) මහාවංසය (4) දීපවංසය

**2.** මහාවංස ටීකාව ලෙස සැලකෙන ග්‍රන්ථය මින් කුමක්ද?
(1) සීහල අට්ඨකතා මහාවංසයයි. (2) ධම්පියා අටුවා ගැටපදයයි.
(3) සීහලවත්ථුපකරණයයි. (4) වංසත්ථප්පකාසිනීයයි.

**3.** මහාවංසයේ පළමු කොටස රචනා කරන ලද්දේ,
(1) මහානාග හිමියන් ය. (2) මංගල හිමියන් ය.
(3) මහානාම හිමියන් ය. (4) මහාසේන හිමියන් ය.

**4.** " ඉතිහාසය යනු එක් විෂයක් නොව විෂයන් සියල්ලේ අන්තර්ගත ගෘහයයි." මෙම ප්‍රකාශය කරන ලද්දේ,
(1) වින්සන්ට් චර්චිල් ය (2) ඊ. එච්. කාර් ය.
(3) ජී. එම්. ටැව්ලියන් ය. (4) ශ්‍රී ජවහල්ලාල් නේරු ය.

**5.** අනුරාධපුර රාජධානියේ ආරම්භක පාලකයා කවුද?
(1) භාතිකාභය රජතුමා (2) පණ්ඩුකාභය රජතුමා
(3) වසභ රජතුමා (4) අසේල රජතුමා

[ 2 වැනි පිටුව බලන්න.

6. සිතුල්පව්ව, තිස්සමහාරාමය, කොටාදැමුහෙළ ආදී ස්ථාන වල සෙල්ලිපි මින් කවර දිස්ත්‍රික්කයකට අයත්වේද?

(1) අනුරාධපුරය (2) මාතර

(3) හම්බන්තොට (4) පොළොන්නරුව

7. රොබට් නොක්ස්ගේ එදා හෙළදිව කෘතිය,

(1) ඕලන්ද මූලාශ්‍රයකි. (2) ඉංග්‍රීසි මූලාශ්‍රයකි.

(3) පෘතුගීසි මූලාශ්‍රයකි. (4) චීන මූලාශ්‍රයකි.

8. ලන්දේසි වෙළඳ සමාගමකට අයත් කාසි වර්ගයක් ලෙස,

(1) OVC (2) COV

(3) VOC (4) CVO ලෙස හැඳින්වේ.

9. ශ්‍රී ලංකාවේ පේදුරු තුඩුවේ සිට දෙවුන්දර තුඩුව දක්වා කි. මී. වලින් නම් කීයද?

(1) 446 (2) 447

(3) 448 (4) 449

10. ප්‍රාග් ඓතිහාසික තොරතුරු ඇතුළත් පාහියන් ගල පිහිටා ඇත්තේ කවර දිස්ත්‍රික්කයකද?

(1) නුවර එළිය (2) කෑගල්ල

(3) කළුතර (4) රත්නපුර

11. ලම්බකර්ණ වංශ රජ පෙළපතේ ආරම්භක පාලකයා ලෙස සැලකෙන්නේ,

(1) ධාතුසේන (2) මුගලන්

(3) වසභ (4) දේවානම්පියතිස්ස

12. 1017 දී මෙරට ආක්‍රමණය කල චෝල පාලකයා වූයේ කවුරුන්ද?

(1) රාජ රාජ රාජේන්ද්‍ර (2) පළමු වන රාජේන්ද්‍ර

(3) කාලිංග මාඝ (4) මහා රාජ රාජ

13. සුප්‍රකට ස්වේදගොන් චෛත්‍ය පිහිටියේ,

(1) කාම්බෝජයේය. (2) තායිලන්තයේය.

(3) බුරුමයේය. (4) ලාඕසයේය.

14. ග්‍රීසිය අත්පත් කරගත් මැසිඩෝනියානු රජු කවුද?

(1) ඔගස්ටස් සීසර් (2) මහා ඇලෙක්සැන්ඩර්

(3) දෙවන පිලිප් (4) ජුලියස් සීසර්

15. ඔලිම්පික් ක්‍රීඩාවේ ආරම්භය සිදුවූයේ,

(1) සුමේරියාවේය. (2) රෝමයේය.

(3) බැබිලෝනියාවේය. (4) ග්‍රීසියේය.

- අංක 16 සිට 20 තෙක් එක් එක් ප්‍රශ්නය සඳහා නම් හතර බැගින් දී ඇත. ඒවා අතුරින් එක් නමක් කවර හෝ හේතුවක් නිසා අනෙක් නම සමඟ නොගැළපේ. එම නොගැළපෙන නාමය තෝරන්න.

16. (1) එරමුදු වැව (2) කලා වැව
(3) දූඹුටුලු වැව (4) තෝපා වැව

17. (1) රුවන්වැලි මහා සෑය (2) ලෝවාමහාපාය
(3) අභය ගිරිය (4) ථූපාරාමය

18. (1) බිසෝ කොටුව (2) ධාතු ගර්භය
(3) කොත්කැරැල්ල (4) පේසා වළලු

19. (1) නන්දිමිත්‍ර (2) දීඝජන්තු
(3) ඵේරපුත්තාභය (4) සූරනිමල

20. (1) සීගිරිය (2) දඹදෙණිය
(3) යාපහුව (4) කුරුණෑගල

- අංක 21 සිට 25 තෙක් ප්‍රශ්නවල නාම / ප්‍රකාශන යුගලය බැගින් දී ඇත. ඒවා අතුරින් එක් නාම / ප්‍රකාශන යුගලයක පද එකිනෙකට නොගැළපේ. එම නොගැළපෙන නාම / ප්‍රකාශන යුගලය තෝරන්න.

21. (1) කාවන්තිස්ස - විහාරමහාදේවී (2) වළගම්බා - සෝමාදේවි
(3) පළමු වන විජයබාහු රජු - ලීලාවතී කුමරිය (4) කුරුණෑගල

22. (1) ඩේරියස් - පර්සියාව (2) ජූලියස් සීසර් - රෝමය
(3) පෙක්වේ - ජපානය (4) පෙරික්ලීස් - ග්‍රීසිය

23. (1) දේවානම්පියතිස්ස - තිසා වැව (2) වසභ - හුරුළු වැව
(3) පණ්ඩුකාභය - අභය වැව (4) ධාතුසේන - කලා වැව

24. (1) පයිතගරස් - නවීන විද්‍යාවේ පියා (2) හිපොක්‍රටීස් -වෛද්‍ය විද්‍යාවේ පියා
(3) ආකිමිඩීස් - ජලෝත් පීඩන න්‍යාය (4) ඇරිස්ටෝටල් - තර්ක ශාස්ත්‍රයේ පියා

25. (1) වළගම්බා - අභයගිරිය (2) මහා පරාක්‍රමබාහු - ගල් විහාරය
(3) මහසෙන් රජු - රන්කොත් වෙහෙර (4) iii විජයබාහු රජු - දඹදෙණිය විජයසුන්දරාරාමය

[ 4 වැනි පිටුව බලන්න.

- අංක 26 සිට 30 තෙක් එක් එක් ප්‍රශ්න සඳහා (A), (B), (C), හා (D) යන ප්‍රතිචාර හතරක් දී ඇත. ඒවා අතුරෙන් දෙකක් නිවැරදි ය. එම නිවැරදි ප්‍රතිචාර දෙක තෝරා,

  (A) සහ (B) පමණක් නිවැරදි නම්, අංක 1 ද,
  (B) සහ (C) පමණක් නිවැරදි නම්, අංක 2 ද,
  (C) සහ (D) පමණක් නිවැරදි නම්, අංක 3 ද,
  (A) සහ (D) පමණක් නිවැරදි නම්, අංක 4 ද,

**26.** මහින්දාගමනයට පෙර මෙරට වැසියන් බුදු දහම පිළිබඳව දැන සිටි බව තහවුරු වන්නේ පහත සඳහන් කවර ප්‍රකාශ වලින්ද?

(A) - ථූපාරාම දාගැබ ඉදිකර තිබීම.
(B) - භද්දකච්චායනා ඇතුළු පිරිස බෞද්ධ පිරිසක් වීම.
(C) - සුමන සමන් දෙවියන් බුදුන් වහන්සේගේ කේෂධාතු මහියංගන දාගැබෙහි තැන්පත් කර තිබීම.
(D) - අරිට්ඨ කුමරු පැවදි වීම.

**27.** ඇළ මාර්ග නිර්මාණයේදී පැරණි වාරි ශිල්පීන්ගේ තාක්ෂණික දැනුම සම්බන්ධයෙන් පහත සඳහන් කවර ප්‍රකාශ නිවැරදි වේද?

(A) - ඇළ මාර්ගවල අතිරික්ත ජලය හා රොන්මඩ ඉවත් කිරීමට සොරොව් ඉදිකිරීම.
(B) - බෑවුම් සහිත ප්‍රදේශ වලින් ජලය ගලා යාමේදී එහි වේගය පාලනය කිරීමට ගල් කණු සවි කිරීම.
(C) – සුළු බෑස්මක් ඔස්සේ විශාල දුරකට ජලය ගෙන යාම.
(D) - සියළු ඇළ මාර්ග දෙපස කළු ගල් තට්ටු අතුරා ඉවුරු ඛාදනය වැලැක්වීම.

**28.** ලන්දේසීන්ගේ ආර්ථික කටයුතු සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශ මොනවාද?

(A) - කඳුරට ප්‍රදේශයේ කෝපි වගා කිරීම.
(B) - සහල් නිශ්පාදනය වැඩි කිරීම සඳහා මුතුරාජවෙල අස්වැද්දීම.
(C) – බොල්ගොඩ ඇළ කරවීම.
(D) - කම්කරු පන්තියක් බිහිවීම.

**29.** පළමු වන පරාක්‍රමබාහු රාජ්‍ය සමය හා සම්බන්ධයෙන් පහත සඳහන් කවර ප්‍රකාශ නිවැරදි වේද?

(A) - හැටදාගෙය ඉදිකිරීම.
(B) - පොළොන්නරු දළදා මැඳුරේ ආරක්ෂාව වේලෛකාර හමුදාවට පැවරීම.
(C) - දැදිගම කොටවෙහෙර දාගැබ කරවීම.
(D) - කම්කරු පන්තියක් බිහිවීම.

**30.** චෝලයින් පොළොන්නරුව රාජ්‍ය මධ්‍යස්ථානය ලෙස තෝරා ගැනීමට තුඩු දුන් හේතු අතරින් පහත සඳහන් ප්‍රකාශ කොතෙක් දුරට නිවැරදි වේද?

(A) - රෝහණයත් පොළොන්නරුවත් අතර ගමන් මාර්ගයේ පිහිටා තිබීම.
(B) - පොළොන්නරුව මල්වතු ඔය ආශ්‍රිතව පිහිටා තිබීම.
(C) - කෘෂිකාර්මික අතින් වැදගත් ප්‍රදේශයක් නොවීම.
(D) - චෝල ආධිපත්‍යට එරෙහිව රෝහණයෙන් එල්ල විය හැකි විරෝධතා පාලනය කිරීමේ හැකියාව.

[ 5 වැනි පිටුව බලන්න.

- අංක 31 සිට 35 දක්වා එක් එක් ප්‍රශ්නයෙහි නාම/ප්‍රකාශන සමූහයක් X හා Y තීරුවල දී ඇත. Y තීරුවේ ඇති නාම ප්‍රකාශන X තීරුවේ ඇති නාම/ප්‍රකාශන සමඟ කිසියම් ආකාරයකට ගැළපේ. එහෙත් ඒවා දක්වා ඇත්තේ ගැළපෙන අනුපිළිවෙලට නොවේ. තීරුවේ ඒවා තීරුවේ අනුපිළිවෙලට සකස් කළ විට ලැබෙන නිවැරදි පිළිතුර තෝරන්න.

31.

| X | Y |
|---|---|
| (1) දඹදෙණිය | A - හතර වන බුවනෙකබාහු |
| (2) යාපහුව | B - හය වන පරාක්‍රමබාහු |
| (3) ගම්පොළ | C - තුන් වන විජයබාහු |
| (4) කෝට්ටේ | D - පළමු වන බුවනෙකබාහු |

(1) B,C,D,A (2) C,D,A,B (3) D,C,A,B (4) B,A,D,C

32 .

| X | Y |
|---|---|
| (1) රළපනාව | A - හතර වන බුවනෙකබාහු |
| (2) සොරොව්ව | B - හය වන පරාක්‍රමබාහු |
| (3) ඇතුළුවාන | C - තුන් වන විජයබාහු |
| (4) පිටවාන | D - පළමු වන බුවනෙකබාහු |

(1) A,D,C,B (2) B,C,A,D (3) B,D,C,A (4) C,B,D,A

33.

| X | Y |
|---|---|
| (1) කුම්භකාරගාම | A - වඩු කර්මාන්තය |
| (2) වඩ්ඪකිගාම | B - රෙදි නිෂ්පාදනය |
| (3) මනිකාරගාම | C - කුඹල් කර්මාන්තය |
| (4) පේසකාරගාම | D - මැණික් කර්මාන්තය |

(1) B,C,D,A (2) C,D,A,B (3) D,C,A,B (4) B,A,D,C

34.

| X | Y |
|---|---|
| (1) මල්වතු ඔය | A - වනවාහිණී නදී |
| (2) කලා ඔය | B - කප්පරකන්ද නදී |
| (3) වලවේ ගඟ | C - ගෝණ නදී |
| (4) මැණික් ගඟ | D - කදම්භ නදී |

(1) B,A,C,D (2) C,D,B,A (3) D,A,B,C (4) D,C,A.B

35.

| X | Y |
|---|---|
| (1) ගල්පොත ශිලා ලිපිය | A - මහා පරාක්‍රමබාහු රජතුමා |
| (2) දෙවනගල සෙල්ලිපිය | B - නිශ්ශංකමල්ල රජතුමා |
| (3) තෝනිගල සෙල්ලිපිය | C - පළමු විජයබාහු රජතුමා |
| (4) වේලෛකාර සෙල්ලිපිය | D - කිත්සිරිමෙවන් රජතුමා |

(1) A,C,B,D (2) B,A,D,C (3) D,A,C,B (4) C,B,A,D

[ 6 වැනි පිටුව බලන්න.

- අංක 36 සිට 40 තෙක් ඇති එක් එක් ප්‍රශ්නයෙහි ප්‍රකාශ දෙක බැගින් ඇතුළත් වේ. ඒ ඒ ප්‍රශ්නයට අදාළව දී ඇති ප්‍රකාශ යුගලයට හොඳින්ම ගැළපෙනුයේ පහත වගුවෙහි දැක්වෙන කුමන ප්‍රකාශ යුගල දැයි එහි අංකය සලකුණු කරන්න.

| වර්ණ අංකය | පළමුවන ප්‍රකාශය | දෙවැනි ප්‍රකාශය |
|---|---|---|
| 1 | නිවැරදි ය. | නිවැරදි ය. |
| 2 | නිවැරදි ය. | වැරදි ය. |
| 3 | වැරදි ය. | වැරදි ය. |
| 4 | වැරදි ය. | නිවැරදි ය. |

| පළමුවන ප්‍රකාශය | දෙවන ප්‍රකාශය |
|---|---|
| 36. දුටුගැමුණු රජු විසින් මිරිසවැටිය චෛත්‍ය ඉදි කරන ලදි. | මහසෙන් රජු විසින් ජේතවනාරාමය ඉදිකරන ලදි. |
| 37.සීගිරිය කාශ්‍යප රජුගෙන් පසු අනුරාධපුර රාජධානියේ පාලන මධ්‍යස්ථානය වීම. | කාශ්‍යප රජු විසින් සීගිරිය කලාගාරයක් ලෙස ගොඩනගන ලදි. |
| 38. කෝට්ටේ අවසාන සිංහල රාජධානියයි. | ධාතුසේන රජු කලා වැව ඉදිකරන ලදි. |
| 39. ශ්‍රී ලාංකික පළමු භික්ෂුව භණ්ඩුක උපාසකයයි. | පළමුවන පරාක්‍රමබාහු රජු කව්සිළුමිණ රචනා කළේය. |
| 40. චෝලයන් විසින් තම පාලන මධ්‍යස්ථානය ලෙස පොළොන්නරුව තෝරා ගන්නා ලදි. | චෝලයන් විසින් පොළොන්නරුව ජනනාථ මණ්ඩලම් ලෙස හඳුන්වන ලදි. |

ඩී.පී සමරවීර
(උත්තර පත්‍ර පරීක්ෂක)

පරිගණක සංස්කරණය - කුමුදු ජානක විජයතිලක
බප/ මිනු/ සරස්වතී මහ පිරිවෙන - බලගල්ල

**2566 - මූලික පිරිවෙන් වර්ෂාවසාන විභාගය - 2022(2023)**

**"සිප්සර සවිය" ඉතිහාසය සිසු නිපුණතා සම්මන්ත්‍රණය**
**(ඉතිහාසය ගුරු පවුර)**

**NEW** **08 S I,II**

**(07) ඉතිහාසය - I, II**

පැ තුනයි

**ඉතිහාසය - II පත්‍රය**

* පළමුවන ප්‍රශ්නය සහ තවත් ප්‍රශ්න හතරක් ද තෝරාගෙන, ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

---

**01.** **(I).** ඔබට සපයා ඇති ශ්‍රී ලංකා සිතියමෙහි පහත සඳහන් සියලු ම ස්ථාන ලකුණු කර නම් කරන්න.

1. දඹකොළපටුන 2. මහාතිත්ථ 3. අනුර
4. සූකරතිත්ථ 5. මහනුවර 6. අනුරාධපුර

*(නිවැරදිව ලකුණු කිරීමට හා නම් කිරීමට ලකුණු 01 බැගින්)*


- පහත දී ඇති **A** හා **B** රූපසටහන් අධ්‍යයනය කොට, ඒ ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

**(II).** (අ) **A** වලින් දැක්වෙන ප්‍රතිමාව කුමක්ද?

(ආ) මෙය දක්නට ලැබෙන්නේ කුමන දිස්ත්‍රික්කයේද ?

(ඇ) මෙය පිහිටා ඇත්තේ කවර ස්ථානයකද?

**A**



(ලකුණු 03 යි)

**(III).** (අ) **B** රූපයෙන් දැක්වෙන නිර්මාණය කුමක්ද?

(ආ) මෙය දක්නට ලැබෙන්නේ කුමන ස්ථානවලද?

(ඉ) මෙහි වම් අතේ දක්නට ලැබෙන්නේ කුමක්ද?

**B**



*(ලකුණු 03 යි)*

**02.** **(I)** මහින්දාගමනයට පෙර ලංකාවේ පැවති ආගමික ඇදහිලි හා විශ්වාස දෙකක් ලියා දක්වන්න.

*(ලකුණු 02 යි)*

**(II)** බුදු දහම ඉතා කෙටි කාලයකින් ශ්‍රී ලංකාව තුළ ව්‍යාප්ත වීමට බලපෑ හේතු හතරක් ලියන්න.

*(ලකුණු 04 යි)*

**(III)** මිහිඳු හිමියන්ගේ වැඩමවීම ශ්‍රී ලාංකේය ජන සමාජයේ පරිවර්ථනයක් ඇතිකිරීමට හේතු වූ අයුරු කරුණු දෙකක් ඇසුරින් ගෙන හැර දක්වන්න. *(ලකුණු 06 යි)*

[ 8 වැනි පිටුව බලන්න.

**03.** **(I)** අනුරාධපුර යුගයේදී රජකම උරුම වූ ක්‍රම දෙකක් නම් කරන්න. *(ලකුණු 02 යි)*

**(II)** රජතුමාගෙන් රටවැසියා බලාපොරොත්තු වූ ප්‍රධාන වගකීම් මොනවාද? *(ලකුණු 04 යි)*

**(III)** අනුරාධපුර යුගයේදී ගම් පාලනය සිදු වූ ආකාරය කරුණු දෙකක් ඇසුරින් පැහැදිලි කරන්න. *(ලකුණු 06 යි)*

**04.** **(I)** පොළොන්නරුව හැඳින්වූ වෙනත් නම් දෙකක් ලියන්න. *(ලකුණු 02 යි)*

**(II)** පළමුවන විජයබාහු රජු තම පාලන මධ්‍යස්ථානය ලෙස පොළොන්නරුව තෝරා ගැනීමට හේතු වූ කරුණු දෙකක් සඳහන් කරන්න. *(ලකුණු 04 යි)*

**(III)** පළමුවන විජයබාහු රජතුමාගේ ආගමික සේවා කරුණු තුනක් ඇසුරින් පැහැදිලි කරන්න. *(ලකුණු 06 යි)*

**05.** **(I)** විජය ඇතුළු පිරිස මෙරට ජනාවාස පිහිටුවාගත් ස්ථාන දෙකක් නම් කරන්න. *(ලකුණු 02 යි)*

**(II)** ඉන්දියානු සංක්‍රමණික ජන කණ්ඩායම් තම ජනාවාස පිහිටුවා ගැනීමේදී වියළි කලාපය තෝරා ගැනීමට තුඩු දුන් හේතු දෙකක් සඳහන් කරන්න. *(ලකුණු 04 යි)*

**(III)** පණ්ඩුකාභය රාජ්‍ය සමයේ මෙරට ඉතිහාසයේ වැදගත් වීමට හේතු දෙකක් පැහැදිලි කරන්න. *(ලකුණු 06 යි)*

**06.** **(I)** පෘතුගීසීන් හා උඩරට රාජධානිය අතර ඇති වූ සටන් දෙකක් නම් කරන්න. *(ලකුණු 02 යි)*

**(II)** පෘතුගීසීන්ගේ උඩරට ආක්‍රමණ අසාර්ථක වීමට තුඩු දුන් හේතු දෙකක් සඳහන් කරන්න. *(ලකුණු 04 යි)*

**(III)** පෘතුගීසීන් මෙරටට පැමිණීමේ ප්‍රතිඵලයක් ලෙස ශ්‍රී ලාංකික සමාජයට එකතු වූ නවාංග දෙකක් පැහැදිලි කරන්න. *(ලකුණු 06 යි)*

**07.** අනුරාධපුර යුගයේ වාරි මාර්ග පද්ධතිය ශ්‍රී ලංකා ශිෂ්ඨාචාරයේ ශ්‍රේෂ්ඨතම දායාදය විය.

**(I)** වසබ යුගයේ ඉදි කරන ලද මහ වැව් දෙකක් නම් කරන්න. *(ලකුණු 02 යි)*

**(II)** **A -** මහසෙන් රජු ඉදි කළ ඇළ මාර්ග දෙකක් නම් කරන්න.

**B -** ධාතුසේන රජු ඉදි කළ ඇළ මාර්ග දෙකක් නම් කරන්න. *(ලකුණු 04 යි)*

**(III)** වැව් හා බැඳුණු ප්‍රධාන අංග දෙකක් නම් කර එමඟින් ඉටු වන සේවය පැහැදිලි කරන්න. *(ලකුණු 06 යි)*

**ඩී.පී සමරවීර**
**(උත්තර පත්‍ර පරීක්ෂක)**

පරිගණක සංස්කරණය - කුමුදු ජානක විජයතිලක
බප/ මිනු/ සරස්වතී මහ පිරිවෙන - බලගල්ල

# 2566 - මූලික පිරිවෙන් වර්ෂාවසාන විභාගය - 2022(2023)


**"සිප්සර සවිය" ඉතිහාසය සිසු නිපුණතා සම්මන්ත්‍රණය**

**(ඉතිහාසය ගුරු පවුර)**

**(07) ඉතිහාසය - I, II**

**II** වන කොටසේ ප්‍රශ්න අංක 1 (i) ට පිළිතුරු සැපයීම සඳහා මෙම සිතියම භාවිත කරන්න. පිළිතුරු සැපයීමෙන් පසුව මෙය ඔබේ පිළිතුරු පත්‍රය සමඟ අමුණා භාරදෙන්න.

**1 (i)**



## මූලික පිරිවෙන් පළමුවාර / මධ්‍යවාර / වර්ෂාවසාන විභාගය - 20.......

### බහුවරණ උත්තර පත්‍රය/பல்தேர்வு விடைத்தாள்/MCQ Answer Sheet

විෂයය සහ විෂය අංකය
பாடமும் பாட எண்ணும்
Subject and Subject No.

මාධ්‍යය
மொழிமூலம்
Medium

විභාග අංකය
சுட்டெண்
Index No.

.......................................................................

විභාග අංකය හා අනිකුත් තොරතුරු නිවැරදි බවට නිරීක්ෂකගේ අත්සන හා දිනය
சுட்டெண்ணும் ஏனைய விபரங்களும் சரியானவை என்பதற்கான நோக்குனரின் கையொப்பமும் திகதியும்
Invigilator's signature and date for correct Index Number and other details

| | | | |
|---|---|---|---|
| 1 ① ② ③ ④ ⑤ | 11 ① ② ③ ④ ⑤ | 21 ① ② ③ ④ ⑤ | 31 ① ② ③ ④ ⑤ |
| 2 ① ② ③ ④ ⑤ | 12 ① ② ③ ④ ⑤ | 22 ① ② ③ ④ ⑤ | 32 ① ② ③ ④ ⑤ |
| 3 ① ② ③ ④ ⑤ | 13 ① ② ③ ④ ⑤ | 23 ① ② ③ ④ ⑤ | 33 ① ② ③ ④ ⑤ |
| 4 ① ② ③ ④ ⑤ | 14 ① ② ③ ④ ⑤ | 24 ① ② ③ ④ ⑤ | 34 ① ② ③ ④ ⑤ |
| 5 ① ② ③ ④ ⑤ | 15 ① ② ③ ④ ⑤ | 25 ① ② ③ ④ ⑤ | 35 ① ② ③ ④ ⑤ |
| 6 ① ② ③ ④ ⑤ | 16 ① ② ③ ④ ⑤ | 26 ① ② ③ ④ ⑤ | 36 ① ② ③ ④ ⑤ |
| 7 ① ② ③ ④ ⑤ | 17 ① ② ③ ④ ⑤ | 27 ① ② ③ ④ ⑤ | 37 ① ② ③ ④ ⑤ |
| 8 ① ② ③ ④ ⑤ | 18 ① ② ③ ④ ⑤ | 28 ① ② ③ ④ ⑤ | 38 ① ② ③ ④ ⑤ |
| 9 ① ② ③ ④ ⑤ | 19 ① ② ③ ④ ⑤ | 29 ① ② ③ ④ ⑤ | 39 ① ② ③ ④ ⑤ |
| 10 ① ② ③ ④ ⑤ | 20 ① ② ③ ④ ⑤ | 30 ① ② ③ ④ ⑤ | 40 ① ② ③ ④ ⑤ |

වැරදි ප්‍රතිචාර සංඛ්‍යාව
பிழையான துலங்களின் எண்ணிக்கை
No.of incorrect responses

උත්තර පත්‍ර පරීක්ෂක සංකේත අංකය හා අත්සන/
விடைத்தாள் பரீட்சகர்களின் குறியீட்டெண்ணும் ஒப்பமும்/
Code No. and Signature of Marking Examiner

1.
2.
3.

ඇගයීම් ලකුණු තහවුරු කිරීමේ පරීක්ෂක සඳහා
கணிதப் பரீட்சகருக்காக
For E.M.F.

නිවැරදි ප්‍රතිචාර සංඛ්‍යාව
சரியான துலங்களின் எண்ணிக்கை
No.of correct responses